it is necessary that he understands what he reads and I am not sure Gota understands economic policy. This is the very first time Gota has made a claim to that understanding.
The aforementioned Sinhala Diaspora have cried out in emails and FB about the “great economic vision of Gotabhaya Rajapakse.” Gota maybe himself embarrassed. Look at the vision and you will find that they contain very commonly bandied about economic slogans that are cliches or platitudes today. I will mention a few:

1. That the global economic centre will shift to China, India and the South East. Our Prime Minister, Ranil Wickremasinghe, has been saying that for many years. One reason why the government is having Free Trade Agreements with countires in the region is part of this vision. Our GMOA had a one- day strike that deprived sick patients of urgent attention, due to the Singapore Agreement. They earlier struck work because of the propose Agreement with India. GMOA undersatnds no economics
2. That economic development is the answer to all ills of the island
3. The urgent need to restrcutue our economy. This has been stated over and over again by reputed ecomists and the World Bank. It is also a task that the government has undrtaken to do.
4. The need to build a knowledge economy in view of the digital revolution
5. The need to encourage direct foreign investment
6. That economic zones must be set up around ports. This is already been done and the recent Hambantota Project is also that
7. The need for ensuring that we get loans only if they are repayable by the project itself.

The above are pretty simple and oft-stated proposals. **In fact Minister for Development Strategy Malik Samarawickema, has written to the Dinamina pointing out how Gota’s “vision,” is a total copy of the Government’s Vision plan for year 2025.**

This shows what a big and empty hocus pocus Gota’s Viyathmaga is. He announces this with impressive fanfare before an audience of businessmen invited to Shangrila Hotel. We are being told that Gota had sold the land where Shnagrila stands, to China and that it is the same block where the Degence Ministry stood. The country’s Defence Ministry is now homeless. In this context, it intersting to investigate whether Gota was given the Hotel for this event as a consdieartion by the Chinese owners. If it were so, then Gota is gulty of bribery.

sjturaus@optusnet.com.au



Shyamon Jayasinghe



# මී වදයෙන් නික්ම ගිය මී මැස්සා...

## ප්‍රියන්ත ප්‍රනාන්දු මතකය

**මී වදයකි ජීවිතේ...**
**මී පැණි පිරීලා ඇතේ..**
**මත් වීලා...ගුම් ගුම් නඳ දීලා..**
**සැනසෙමු අපි හිතුමතේ....**

මේ ගීතය අසා නැති පුද්ගලයකු ලංකා ධරණීතලය මත විසුවේ නම් ඔහු හෝ ඇය එක්කෝ බිහිරි විය යුතුය. එසේ නැතිනම් හය හතර නොදන්නා කිරි සප්පයකු විය යුතුය. ඒ මක්නිසාද මේ ගීතය එතරම්ම පොදු ජන තුඩ තුඩ රැව් පිළිරැව් දුන් නිසා වෙනි. මේ ගීතය නොගයමින් ගිය විනෝද චාරිකාවක් නොවීය. එමෙන්ම මෙය නොගැයුණු සාදයක්ද නොවීය.

කවුද හරි  සිනමාපටයේ ඩොමී ජයවර්ධනයන්ගේ රංගනය සමග කෙරුනු ගායනයට පසුබිමින් සැපයුණු ගීතය වූයේ මා මතු සඳහන් කළ  මී වදයක ජීවිතේ නම්වූ මෙම ගීතයයි. එය කෙතරම් නම් අපූරුවට ඩොමී ජයවර්ධනයන්ගේ රූපකාය හා බද්ධවූවාද කියනවානම් අපට සිතුණේම එය ඔහුම ගායනා කරන බවකි. එහෙත් එම ගීතය සැබැවින්ම ගායනා කළේ සී ටී ප්‍රනාන්දු නම්වූ සිංහල සංගීතය නව මා නයකට රැගෙන ගිය අපූරු සංගීතවේදියෙකි. ගායකයෙකි.

සුනිල් සාන්තයන්, ආනන්ද සමරකෝන් සූරීන් හා පී එල් ඒ සෝමපාල වැනි සංගීතයේ උඩුගම් බලා පීනූ සොඳුරු හිතුවක්කාරයන් අතර සී ටී ටද ලැබුණේ අද්විතීය තැනකි.

ඔහුටම ආවේණික කට හඬ , වෙනස්මවූ ගායනා ශෛලිය හා බටහිර ආරට නෑකම් කියූ හදවතේ ලැගුම් ගන්නා සුලූ සංගීතය බාල , තරුණ හා මහලූ යන සියලූම වයස් මට්ටමේ රසිකයනට රස විඳිය හැකි විය. සරළ , සුගම්‍ය පදමාලාවලින් විරචිත එතුමන්ගේ ගීත එක් වරක් ඇසූ පමණින් මතකයේ රැදෙන ගුණයෙන් අනූන විය.

සී. ටී ප්‍රනාන්දු ගැන සිහි කිරීමේදී මගේ මතකය නිතැතින්ම දිව යන්නේ 70 දශකයේ අග භාගයටය. එකල මගේ පුංචි සවනට හැම සවසකම හා සති අන්තයකම වාගේ ඇසුණු සංගීතයකි. එය ඇදී ආවේ පුරුදු පුහුණුවීම්වල යෙදීවුන් තූර්යවාදක කණ්ඩායමකිනි. එවකට අනුරාධපුරයේ ශාන්ත ජොසෆ් දේවස්ථානයට යාබදව පිහිටා තිබූ ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය පාසලේ නේවාසිකාගාරයේ නේවාසික සිසුවියන් එම තූර්යවාදක කණ්ඩායමට අයත් වූහ. එම ගීතය වූයේ හෙළජාතික අභිමානයේගීතයයි. එමෙන්ම එකල ගුවන් විදුලියේ උදා ගී යටතේ වාදනය වූ මෙම ගීතය හා එතුමන්ම ගැයූ අවදිවන්න.. අවදිවන්න.. දීප්තිමත් දිනකි උදාවෙලා තියෙන්නේ.. යන ගීතයද මට අද මෙන් මතකය. මේ දැන් ඇසෙනවා වැනිය.

එහෙත් අපේ අවාසනාවට 1977 වසරේදී , එනම් අප යන්තම් සිංදුවක රස විඳින්නට පටන් ගත් විටම වාගේ එතුමා වියෝ වීම නිසාවෙන් එතුමා සජීවීව රස විඳීමේ අවස්ථාව මා ඇතුළු අපගේ සමකාලීනයින්ගෙන් හා අපට පසුව ඉපැදුණු පරපුරට අහිමි විය. මිය යන විට එතුමන් යන්තම් වයස අවුරුදු 56 ක් වූවා පමණි.

එය එසේ වුවද යම් තරමකින් අප වාසනාවන්තයින්ද වූයෙමු. ඒ එතුමන්ගේම හඬ ජීවමාන කිරීමට සමත් වූ පුත්‍ර රත්නයක් එතුමන්ගේ වියෝවත් සමගම ගායනා ලොවේ උපත ලැබීම නිසාය. ඒ වෙන කවුරුන් හෝ නොව සී ටී පුත්, ප්‍රියන්ත ප්‍රානාන්දුය. සී. ටී ගේ ගීත අපට හරිහැටියට සවන් දීමට හොඳ තත්වයේ වූ පටිගත කිරීමක් හෝ නොතිබුණ නිසා අප සී ටී ගීත ඇසුවේ ප්‍රියන්තගේ හඬිනි. සී ටී ගේ වීඩියෝවක්වත් නොතිබූ නිසා සී ටී රුව අප දුටුවේ හා එතුමන්ගේ අංග චලන හා ගීත ගායන විලාසය අප සිතා ගත්තේ ප්‍රියන්ත ප්‍රනාන්දුගෙනි.

සී ටී ගීත රස ආකරයේ ගීත ගොන්න අතර මී අඹ වනයේ, කිමද සුමිහිරියේ,මා බාල කා ලේ, සඳ වට රන් තරු,සිහින ලොවේ මිහිර මැවූ මාලී,ආනෙ ඩිංගක් ඉන්නකෝ,මගෙ සුදු මාමේ, පුන් සඳ හිනැහෙන්නේ, ලෝ අඩ නින්දේ,හෙළ ජාතික අභිමානේ, අඹ



රුක් සෙවණැල්ලේ, සීගිරි සුකුමාලියේ, බර බාගේ, මල්බර හිමිදිරියේ, අම්බිලි මාමේ, රෑ පැල් රැකලා, අවදි වන්න අවදි වන්න ආදී ගීත අප සවන්පත් සිසාරා ඇදුණේ ප්‍රියන්ත ප්‍රනාන්දුගේ හඬිනි. ඔහු පියාගේ ගීත ජීවමා නකරන ගීතවාහකයා වූයේ එලෙසිනි. එතුමන්ගේ හෙළ ජාතික අභිමානය නොගැයුණු නිදහස් උත්සවයක් අපේ රටේ නොවීය. එම ගීතය නොවැයූ පාසල් හෝ හමුදා තූර්‍ය වාදක මඬුල්ලක් නොතිබුණි. එතුමන්ගේ ගීතයක් නොගැයුණු විනෝද චාරිකාවක් , සාදයක් හෝ ප්‍රිය සම්භාෂණයක් රටේ කොතනකවත් නොවීය. එතරම්ම ඒ ගීත අප අසන, ගයන හා දනන් තුඩ තුඩ රැව් දෙන නිර්මාණ විය.

මා බාල කාලේ හා සඳවට රන් තරු යන ගීත අසා කඳුළක් නෙතගින් නොහැලූ දරුවකු නොසිටියහ. රෑ පැල් රැකලා, මගෙ සුදු මාමේ වැනි ගීතවල තිබූ වෑහෙන ගැමි අසිරියට එතුමන්ගේ කට හඬින් අපව සිහින යෙන් මෙන් ගෙන ගියේ ඒ කට හඬේ වූ ජීව ගුණය නිසාවෙනි. පුන් සඳ හිනැහෙන්නේ, ලෝ අඩ නින්දේ ආදී ගීත අපව රැගෙන ගියේ සඳ පහන් රැයක සඳ දිය උතුරා ගලා හැලෙන වන ලැහැබකටය. සිහින ලොවේ මිහිර මැවූ මාලී හා ආනෙ ඩිංගක් ඉන්නකෝ වැනි ගීත අපගේ සිත් ආදරයෙන් කුල්මත් කරන්නට, ප්‍රේමයෙන් ආතුර කරන්නට සමත් විය.

තම පියාගේ විසල් ගීත සමුදායත් හා ප්‍රෙක්ෂකයාගේ ඒ ගීතවලටම තිබූ ඉල්ලීමත් නිසා ප්‍රියන්ත ප්‍රනාන්දු ගායනවේදීයා ඒ ගායනයන්ටම සීමා වුවත් මට එහි වරදක් නොපෙනේ. මන්ද ඔහු ලෝකයට පැමිණ තිබුණේ ඉතා අඩු වයසකින් වියෝවූ තම පියා ජීවමාන කිරීම උදෙසා නිසාවෙනි. ප්‍රියන්ත ප්‍රනාන්දුගේම ගීත වූ වෙරළේ මුහුදු වැල්ලේ, නිරංජලා කාටදෝ ආදරේලූ දැන් යනාදී ගීත ඔහුගේම වුවත් ඒවායින්ද ගම්‍ය වූයේ සී ටී අනන්‍යතාවමය. එහෙයින් සී. ටී. ත් ප්‍රියන්තත් ගායන ලොවේ දෙදෙනකු නොව එකෙකු බව අපට පැහැදිලිය.

එහෙත් සී ටී වියෝවෙන් පසු ඒ හඬ අපට ජීවමාන කළ ප්‍රියන්ත ප්‍රනාන්දු සහෘදයාද



අපගෙන් වියෝවූ බව කියැවුණු ඒ මූසල පුවත, ලෝක කම්කරු දිනයේ අප වෙත හමා ආවේ රුදුරු කුණාටුවක් විලසිනි. දැන් ඒ යුග දෙකම අවසන් වී හමාරය. එදා 1977 දී ,සී ටී වියෝවෙන් පසු ප්‍රියන්ත ප්‍රනාන්දු නම් වූ තම පුත්‍රයා තුළින් සී ටී නැවත උත්පත්තිය ලැබීය. එහෙත් ඊයේ වසර 65 ක් ආයු වළඳා අපෙන් වියෝ වූ ප්‍රියන්ත ප්‍රනාන්දුගෙන් පසු ඒ හඬ ගෙනයාමට සමත් ඔහුගේම පුතකු හෝ වෙනත් අයෙකු ඇතිදැයි කියා මම නොදනිමි.

මේ සී ටී හඬේ අවසානයද? සිතිවිලි සිරවී ඇත. හදවත ව්‍යාකූලය. දැනෙන්නේ මහා තනිකමකි. මගේ පුංචි කුටියේ කවුළුවෙන් පෙනෙන්නේ හිස් අහසය. බක් මාසයේ කල එළියට බසින්නට නොහැකිව මග වැරදී තනිවූ කොවුලකු යාබද ගසේ අත්තක වසා ඇත. මම ඌ දෙසට කිසිදු අරමුණකින් තොරව බොඳ වූ දෑස් දල්වා ගතිමි.



චන්දන ගුණසේකර